# <u>නිවේදනය</u> **B**

**2018 නොවැම්බර් මස 05 වැනි සඳුදා ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් 2019 වර්ෂය සඳහා අයවැය කථාව ඉදිරිපත් කිරීමට අදාළව පහත සඳහන් විශේෂ ආරක්ෂක විධිවිධාන කලින් වසරවලදී සිදු කළ ආකාරයටම ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා බව සියලුම ගරු මන්ත්‍රීවරුන් වෙත මෙයින් දන්වනු කැමැත්තෙමි.**

- **2018 නොවැම්බර් මස 02 වැනි සිකුරාදා සහ 05 වැනි සඳුදා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විවේක කාමර, ඇඳුම් අල්මාරි ද ඇතුළුව සමස්ත පාර්ලිමේන්තු ගොඩනැඟිල්ලම ආරක්ෂක පරීක්ෂාවට ලක් කරනු ලැබේ.**
- **2018 නොවැම්බර් මස 05 වැනි සඳුදා ආරක්ෂක වැඩ පිළිවෙළ පහත සඳහන් ආකාරයට සිදු කරනු ලබන බවද දන්වනු කැමැත්තෙමි:—**

**(අ)** **මහජන ගැලරිය ආරාධිත අමුත්තන් සඳහා පමණක් සීමා කරනු ලැබේ.**

**(ආ)** **තම කලත්‍රයා කැටුව පැමිණෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට කාර්ය මණ්ඩල පිවිසුමේ දී තම වාහනයෙන් බැස පාර්ලිමේන්තු ගොඩනැඟිල්ලට පිවිසිය හැකි ය.**

**(ඇ)** **ගැලරියට පැමිණෙන ආරාධිත අමුත්තන් වෙනුවෙන් ජයන්තිපුර පිවිසුමේ සිට මහජන පිවිසුම දක්වා විශේෂ ප්‍රවාහන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලබන බැවින් කලත්‍රයා හැර තමන් කැටුව පැමිණෙන වෙනත් ආරාධිත අමුත්තන් වෙතොත් ජයන්තිපුර පිවිසුමේ දී එම ප්‍රවාහන සේවාව වෙත යොමු කරන ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

**(ඈ)** **එදින පාර්ලිමේන්තුවට පැමිණීමේ දී, හැකිතාක් දුරට රියැදුරෙකු කැටුව පැමිණෙන ලෙස ද, අමුත්තන් කැටුව පැමිණීමෙන් වැළකී සිටින ලෙස ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

**(ඉ)** **පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් ම, තම රථය පදවාගෙන එන්නේ නම්, එම මන්ත්‍රීවරුන්ගේ වාහන නියමිත රථගාල වෙත ධාවනය කර ගාල් කරවීම පිණිස මන්ත්‍රී පිවිසුමෙහි, කාර්ය මණ්ඩල පිවිසුමෙහි සහ මහජන පිවිසුමෙහි පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට අයත් රියැදුරන් එම සේවාවේ යොදවනු ලැබේ.**

**(ඊ)** **රථ වාහන පොලිසිය සහ සමීප පොලිස් ස්ථාන මඟින් විශේෂ රථ වාහන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.**

**(උ)** **ඉහත සඳහන් විශේෂ ආරක්ෂක විධිවිධාන සම්බන්ධව සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය අපේක්ෂා කරන බව ද කාරුණිකව දන්වනු කැමැත්තෙමි.**